


දියවන්නා සටන

මුහුණට මුහුණ

අද මුහුණට මුහුණ සංවාදය සඳහා එක්වන්නේ ජාතික ජන බලවේගයේ කුරුණෑගල දිස්ත්‍රික් කණ්ඩායම් නායක, යාපහුව ආසනයේ ප්‍රධාන සංවිධායක නාමල් කරුණාරත්න සහ නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික් අපේක්ෂක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම් දුමින්ද දිසානායක යන අයයි.

# හිටපු චරිත යළි කරළියට ගෙනෙයි කියලා අපි විශ්වාස කරන්නේ නෑ

ජාතික ජන බලවේගයේ කුරුණෑගල දිස්ත්‍රික් කණ්ඩායම් නායක සහ යාපහුව ආසනයේ ප්‍රධාන සංවිධායක **නාමල් කරුණාරත්න**



**● 2024 ජනාධිපතිවරණය සඳහා ඔබ පක්ෂය ඒකායන අරමුණක් සහිතව සූදානම් වීමක් අපි දුටුවා. මහමැතිවරණය සඳහා ජාතික ජන බලවේගයේ සූදානම කෙබඳු ද?**

අපි 2024 පාර්ලිමේන්තු මහමැතිවරණය සඳහා ඉහළින්ම සූදානම්. ජනාධිපතිවරණයේ දී අපි ලබා ගත් විශිෂ්ට ජයග්‍රහණයත් සමඟ ඒ නිහතමානී සතුටත් එක්ක අපිට මේ මැතිවරණය සඳහා මුහුණදීමට විශාල ශක්තියක් ලැබී තිබෙනවා. අපේ නායකත්වය පිළිබඳව වෙනත් දේශපාලන වේදිකාවල ඇති කිරීමට උත්සාහ කළ වැරදි චිත්‍රය ජනතාව එකහෙළා ප්‍රතික්ෂේප කළා. අපි පිළිබඳව ඔවුන් තුළ පැවති විශ්වාසය තහවුරු කළා. ඒ නිසා මේ මැතිවරණය ඉතා පහසුවෙන් බහුතර බලයක් සහිතව ජයග්‍රහණය කිරීමට අපිට ඉතා හොඳ පරිසරයක් නිර්මාණය වී තිබෙනවා.

> ලංකා ඉතිහාසයේ මැතිවරණයකින් පසු පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා කිසිවක් වාර්තා නොවුණු එකම මැතිවරණය 2024 ජනාධිපතිවරණයයි. ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයෙක් බලයට පත් වූ ප්‍රවෘත්තිය වාර්තා කළ විදෙස් ජනමාධ්‍යවලින් ශ්‍රී ලංකාව පමණක් නොව දකුණු ආසියාවේ මැතිවරණ අතරිනුත් ප්‍රචණ්ඩත්වය වාර්තා නොවුණු එකම මැතිවරණය එය බව තහවුරු කළා.

**● ඉකුත් ජනාධිපතිවරණයේ දි ජනතාව විසින් මුදාහරිනු ලැබුවේ එවකට සිටි පාලක පන්තිය කෙරෙහි වූ දැඩි තරහව බවත් එය තාවකාලිකව ඔවුන්ට කළ රිදවීමක් පමණක් බවත් මතයක් තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ ඔබ ඔය හිතන ප්‍රතිඵලය මහා මැතිවරණයේ දී නොලැබෙන්න බැරි ද ?**

හිටපු පාලක පන්තිය ජනතාව විසින් නිර්දය ලෙස ප්‍රතික්ෂේප කළ බව මුළු ලෝකයටම පෙනෙන්න තිබුණු දෙයක්. ජනතාව ඔවුන්ගේ වටිනා ඡන්දය මෙරට දේශපාලනයේ ප්‍රධාන බලකඳවුරු දෙකට නොදී තුන්වැනි බලවේගය ලෙස සිටි අපව පළමු තැනට ගෙනඒම සඳහා පාවිච්චි කළේ කාටවත් රිදවීමේ අපේක්ෂාවෙන්ම නෙමෙයි. ඔවුන්ට පැහැදිලි කලකිරීමක් වගේම ශ්‍රී ලංකාවේ දේශපාලන සංස්කෘතිය වෙනස් කිරීමේ අවශ්‍යතාව ද තිබුණා. ඒ අනුව ඔවුන් මුල්බැසගත් පාලක පන්තිය යළි නොඑන්නටම හරවා යැව්වා. ඔවුන් එඩිතර සහ හෘද සාක්ෂියට එකඟව ගත් තීරණය නැවත නැවතත් තහවුරු කරනවා මිස නැවතත් එම පක්ෂවල හිටපු චරිත කරළියට ගෙනෙයි කියලා අපි විශ්වාස කරන්නේ නෑ. ජනතාව අප කෙරෙහි විශ්වාසය තහවුරු කරගෙන අවසන්.

**● ජනාධිපතිවරණයෙන් පසු ජනතා විශ්වාසය වැඩිවුණා කියල ද ඔබ කියන්නේ ?**

පැහැදිලිවම ඔව්. ලංකා ඉතිහාසයේ මැතිවරණයකින් පසු පශ්චාත් මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා කිසිවක් වාර්තා නොවුණු එකම මැතිවරණය 2024 ජනාධිපතිවරණයයි. ශ්‍රී ලංකාවේ නව ජනාධිපතිවරයෙක් බලයට පත් වූ ප්‍රවෘත්තිය වාර්තා කළ විදෙස් ජනමාධ්‍යවලින් ශ්‍රීලංකාව පමණක් නොව දකුණු ආසියාවේ මැතිවරණ අතරිනුත් ප්‍රචණ්ඩත්වය වාර්තා නොවුණු එකම මැතිවරණය එය බව තහවුරු කළා. අඩුම තරමින් ජයග්‍රහණය සැමරීම සඳහා රතිඤ්ඤා කරලක්වත් අපි පත්තු කළේ නෑ. ජනතාවට අතීතයේ පැවති දේශපාලන සංස්කෘතිය සහමුලින්ම වෙනස් කිරීමේ දැඩි වුවමනාව තිබුණා. කෑකෝ ගහමින් ජයග්‍රහණය ගැන උදම් අනමින්, පළිගැනීම වපුරමින් කරන වැඩපිළිවෙළ ජනතාව දැන් අනුමත කරන්නේ නෑ. ජන විඥානය ජාතික ජන බලවේගය විසින් ඉතා හොඳින් හඳුනා ගැනීමෙන් පසුවයි ජනාධිපතිවරණයට අපි මුහුණදුන්නේ. ජනතාව අපේක්ෂා කළ පරිසරය අපි වෙනස් කළේ නෑ. ජනතා විශ්වාසය අබ මල් රේණුවක තරම්වත් බිඳ දැම්මේ නෑ. ජනාධිපතිවරණයේ දී අපට ඡන්දය ලබා නොදුන් අයත් අද අපි වටා පෙළගැසී සිටින්නේ ජනතා විශ්වාසය අපි තහවුරු කළ නිසයි.

**● සෑම පාර්ලිමේන්තු මැතිවරණයකදීම අපි දකින්නේ මනාප පොරයක්. එම පොරය නිසාම කළු පැල්ලම් තැවරූ දේශපාලන සංස්කෘතියක් රට තුළ ඇති වුණා. ඔබ පක්ෂයේ වෙනසක් කියන සංකල්පය තුළ ඔය කියන කාරණාව ඇත්තෙම නැද්ද?**


අපි යන්නේ සාමූහික ගමනක්. එකිනෙකා පරයා මනාප ලබාගෙන කොහොම හරි පාර්ලිමේන්තුවට යන්න දඟලන ක්‍රමයක් අපි ළඟ නෑ. පාර්ලිමේන්තුවට යන්නෙ කවුද කියන එක තීරණය කරන්නේ මැතිවරණ කොමිසමයි. ජනතාවට පුළුවන් අපේ පක්ෂයේ කවුරු නමුත් කැමැති පුද්ගලයාට ඡන්දය ලබා දෙන්න. මනාප ලබා ගැනීමේ හෝ තව කෙනෙක් පරාජය කිරීම සඳහා ඡන්ද පොරයට අපි කවුරුත් පෞද්ගලික ධනය විසි කරන්නේ නෑ. අපි මේ සඳහා වැය වන යම් මුදලක් තිබෙනවා නම් ඒකත් කරන්නේ සාමූහික ජයග්‍රහණය වෙනුවෙන්මයි. පුද්ගල සාධකය කියන එක අපිට වැදගත් නෑ. පොදු සාධකයයි අපේ පක්ෂයේ දැක්ම.

**● ඔබේ පක්ෂයෙන් මැතිවරණයට ඉල්ලන්නේ අලුත්ම මුහුණු කවුද මේ අය?**

අපේ අපේක්ෂක ලැයිස්තුවේ ඉන්න සියලු දෙනාම අලුත් අය කිව්වට ඔවුන් විවිධ සමාජ ක්‍රියාකාරිකයන්. ඔවුන් ප්‍රාදේශීයව ජනාතව අතර සිටින පුද්ගල චරිත. අපේ අපේක්ෂකයන් ඇතැම් අය අර්ථකථනය කරන ආකාරයට, ජනප්‍රිය නැති වෙන්න පුළුවන්. දේශපාලන ක්ෂේත්‍රයේ වැඩි පිරිසක් වැඩි දෙනෙක් දන්නේ ඔවුන් විසින් සිදු කරන ලද වැරදි නිසානේ. අපි එවැනි හේතු මත ජනප්‍රියත්වයට පත්වුණු පුද්ගලයන්ට අපේක්ෂකත්වය දීලා නෑ. වෘත්තීයවේදීන්, ආචාර්යවරුන්, මහාචාර්යවරුන්, නීතිඥයන් ආදී සෑම ක්ෂේත්‍රයකින් හොඳ නම දිනා ගත් අය අපේ ලැයිස්තුවේ ඉන්නවා. ජාතික ජන බලවේගය කියන්නේ සාමූහික කණ්ඩායමක් එතැන ඉන්නේ ජේවීපී අය විතරක් නෙමෙයි. අපේ ප්‍රතිපත්ති රාමුව අනුමත කරන, පිළිගන්නා අයට අපිත් එක්ක එකතු වීමට කිසිදු බාධාවක් නෑ. පොදු ආකෘතියක වැඩි කිරීම මිස අලුත් පරණ භේදයක් නෑ.

**සකුන්තලා ජයසිංහ**





# ආණ්ඩුවේ කකුලෙන් අදින්නවත්, වට්ටන්නවත් අපි සූදානම් නැහැ

නව ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ අනුරාධපුර දිස්ත්‍රික් අපේක්ෂක හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහලේකම් **දුමින්ද දිසානායක**

> රාජ්‍ය සේවකයන්ගේ ඉකුත් වැඩවර්ජන පසුපස හිටියේ කවුද කියලා රට දන්නවානේ. ඒ වෘත්තීය සමිති මෙහෙයවුණේ කොහොමද කියන එකත් අමුතුවෙන් කියන්න ඕනෑ නැහැනේ. එතකොට රුපියල් 20,000 පඩි වැඩිවීමක් ගැන ඉල්ලීම් ලැබුණා. ඒත්, අප එය කළ නොහැකි බව පැහැදිලිව කියා සිටියා. ඊළඟට උදය ආර්. සෙනවිරත්න කොමිසම පත් කළා. සාකච්ඡා කළා.

**● අනුරාධපුරයෙන් ජනාධිපතිවරයකු පත්වීම ගැන මොකද හිතන්නේ ?**

ඒ ගැන සතුටු වෙනවා.

**● තරුණ මන්ත්‍රීවරුන්ට මෙවර වැඩි ඉඩක් ලැබෙතැයි ඇතැමුන් මත පළ කරනවා ?**

ඔව්. ඒක එහෙම වෙන්න පුළුවන්. හැබැයි, වෘත්තිකයන් වැඩිපුර පාර්ලිමේන්තු යැවීම වැදගත්ය කියන කාරණය ඇතුළේ ගැටලු තියෙනවා. දේශපාලනය පිළිබඳ අත්දැකීම් සහිත වූ විටයි එහි නිරතවීම පහසු වෙන්නේ. ඇතැම් පක්ෂවලට පළාත් පාලන ආයතනවල බලය ලැබුණු අවස්ථාවලදී කටයුතු කර ගන්න බැරිවුණු අවස්ථාවලට උදාහරණ ජනතාවට තියෙනවා.

මං 2000 වර්ෂයේදීයි පාර්ලිමේන්තු ආවේ. ඒ මෙරට ළාබාලම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා විදිහටයි. ඉතින්, අනුර දිසානායක මහතාත් ඊට ආසන්න කාලයකදීයි මුලින්ම පාර්ලිමේන්තුවට පත් වුණේ. එතෙක් මෙතෙක් මමත් අවුරුදු 24ක් තිස්සේ පාර්ලිමේන්තුවට තේරී පත් වුණා. ඒ අනුව, පාර්ලිමේන්තු කටයුතුවලට සහභාගි වෙමින් දේශපාලනය කරමින් එහි අත්දැකීම් ඇති බව අත්‍යවශ්‍යයි. නොඑසේ නම් ව්‍යාකූල, ගැටලුසහගත තත්ත්වයක් තමයි ඇති වෙන්නේ. ඒ අනුව වසර 24ක් පාර්ලිමේන්තුවේ කටයුතු කළ අනුර කුමාර මහතාටත් අත්දැකීම් තිබුණා. එතරම්ම විශාල කාලයක් දේශපාලනයේ නිරතවීමෙන් පසුවයි ඔහු ඉකුත්දා ජනාධිපතිවරණයෙන් ජයග්‍රහණය කළේ. ඒ දේශපාලනික පරිණතවීම අවශ්‍යයි. ඔහුටත් පරිපාලනය පිළිබඳ එතරම් අත්දැකීම් නැති වුණත් දේශපාලනයේ නිරත වීමෙන් ලද අත්දැකීම් ජනාධිපතිවරණය ජය ගැනීමේදී බලපෑවා. ඒ දෙය නැති වුණොත් දේශපාලනඥයකුට සාර්ථක වෙන්න අමාරුයි. උගතුන් පාර්ලිමේන්තු එවීම ගැන කතා කරන අය ඒ ගැනත් හිතා බලන්න ඕනෑ. දේශපාලනය පිළිබඳ අත්දැකීම් නැති උගතුන්, වෘත්තිකයන්ට තවත් අවුරුදු 5 - 10ක් පමණවත් ඒ පිළිබඳ අත්දැකීම් ලබන්න ගත වෙනවා. තරුණයන්ට ඒ ඇරඹුම හොඳ එකක් වුණත් ක්‍රියාකාරීව හරියාකාරව කටයුතු කරන්න නම් කල් ගත වෙනවාමයි.

*** වංචාව දූෂණය තුරන් කිරීම ආදී මාතෘකා රැසක්ම මෙවරත් පෙරට ඇවිත් නේද ?**

ඒත්, ඉකුත් අවුරුදු 75ක පමණ කාලයේදී මොනවාද කළේ කියලා අහන්න බලයට පත්වූ අයට හරිම පහසුයි. ඒ තරම් ඒ ගැන කියන්නට හැකි වෙන පිරිසකුත් නැහැනේ. ඒ අයට තියෙන ලොකුම දේ තමයි, මින් පෙර කවමදාවත් ඒ අයට දේශපාලන බලයක් ලැබී නැතිකම. ඉතින්, අනුන් කළ දේ මතින් තමයි ඒ අයත් රැඳී සිටියේ. අනුරාධපුරයට ඒ අය වැඩක් කරලාත් නැහැනේ. අපිටත්, යූ.එන්.පීයටත් කළ දේ ගැන කියන්න දේ ඕනෑ තරම් තියෙනවා. අනුරාධපුරය නිදසුනකට ගත් විටත්, අවුරුදු 75කට පමණ පෙර තිබූ තත්ත්වයත් අද විදිහත් කියන, දෙක පෙන්නුම් කරන පින්තූර වෙන වෙනම අරන් බැලුවොත් අවුරුදු 75ක් අපි මොනවාද කළේ කියා, දේශපාලන තේමා පාඨ ඔසවා ගෙන එන, අයටත් හොඳින්ම පිළිතුරු ලැබෙයි. අපි එදා ඉඳන් අනුරාධපුරයට වැඩ කරමින් ඉන්නේ.

**● ඒත් ඔබලා පැරදුණා?**

මැතිවරණයක් පැරදුණා කියලා අපි මොනම හේතුවක් නිසාවත් පසුබසින්නේ නැහැ. ඒ තමයි ජයග්‍රහණයේ ආරම්භය. මං කලින් සඳහන් කළ ඡන්ද ලක්ෂ 48ම ශ්‍රීලනිප, යූඑන්පී. පොදුජන පෙරමුණ ආදියටයි අයිති. ඒ ඒ අයගේ පක්ෂ තිබියදීයි මේ රැල්ල එක්ක ඡන්දදායකයන් වෙනස් වුණේ. ඒ අයට නැවත මෙවර වෙනස් තීන්දුවක් ගැනීමේ හැකියාව බොහෝ දුරට තියෙනවා. පාක්ෂිකයකු පක්ෂයකට බද්ධවීමත් සමඟයි ඒ පක්ෂය හැර නොයන්නේ. ඒත්, මේ අස්වාභාවික ඡන්ද වැඩිවීම වෛරය, වෙනසක අවශ්‍යතාව මෙන්ම මෙරට දේශපාලන පක්ෂයක සාමාජිකත්වය නොලබා ගත් තීන්දුවක්. මේ රැල්ලේ පොරොන්දු ඉටු නොවන විට එය හැර යෑමත් එතරම්ම සාමාන්‍යයි.

**● මාලිමාව බිම තැබූ තැනින් කොඩිය ගන්න සූදානම් කියලා ඔබ ඉකුත්දා ජනමාධ්‍යයට කියා තිබුණා ?**

රාජ්‍ය සේවකයන්ගේ ඉකුත් වැඩවර්ජන පසුපස හිටියේ කවුද කියලා රට දන්නවානේ. ඒ වෘත්තීය සමිති මෙහෙයවුණේ කොහොමද කියන එකත් අමුතුවෙන් කියන්න ඕනෑ නැහැනේ. එතකොට රුපියල් 20,000 පඩි වැඩිවීමක් ගැන ඉල්ලීම් ලැබුණා. ඒත්, අප එය කළ නොහැකි බව පැහැදිලිව කියා සිටියා. ඊළඟට උදය ආර්. සෙනවිරත්න කොමිසම පත් කළා. සාකච්ඡා කළා. 20 - 50% අතර මට්ටම්වලින් ඒ ඒ ආයතනවල සියල්ලන්ට එළැඹෙන ජනවාරියේ සිට දීමට තීරණය වුණා. ඒත්, ඉකුත් ඡන්ද පොරොන්දු අතර ජීවන වියදමට අනුව සය මසකට වරක් වැටුප් වැඩි කිරීමක්, ගැළපීමක් කරනවා කියලා බලයට පැමිණි අය කිවුවා. ඒත් දැන් ඉන් මසක් ගතවීමටත් කලින් එහෙම දෙයක් ගැන කතා කළේ නැති බව ආණ්ඩුවේ පාර්ශ්වයෙන්ම ඇහෙනවා.

පහුගිය කාලයේම කියන දේ කරනවා කියන අය දැන් කියන දේ ඉතා ගැටලුසහගතයි. මේ විදිහට බොරුකීම, ජනතාව රැවටීම හොඳ නැහැ. එදා රාජ්‍ය සේවකයා අද තනිවෙලා. ඒ අය ගැන කතා කරන්න කෙනකු නෑ. ගිය වතාවේ අපිට විරුද්ධව ඡන්දය දුන්නත් ඔවුන් සමඟ අපි දිගුකලක් කටයුතු කර තියෙනවා. රාජ්‍ය සේවකයන් මෙරටට අවශ්‍යයි. දැන් කොඩිය බිමින් තියලා. රාජ්‍ය සේවකයන් වෙනුවෙන් කතා කරන්නට වෘත්තීය සමිති නියෝජනයක්වත් නැති තත්ත්වයක් අද තියෙන්නේ. හැබැයි, අත්දැකීම් විරහිත ආණ්ඩුවට වැඩ කරන්න කල් දෙන්න ඕනෑ. ඒ නිසා, මේ අරගල කරන්න කාලය නෙවෙයි. බලයට එන්න කලින් ආණ්ඩුව රජයේ ඇතැම් නිලධාරින් වහා ඉවත් කරනවා කිවුවත් එහෙම අපේක්ෂක කාලේ කියූ දේ අද නිවැරදි නැහැ කියලා හිතෙනවා වෙන්නත් පුළුවන්. එහෙම නම් හිටපු අය මදි බවක් හැඟෙන්න ඇති. අලුත් අය ගෙනාවා නම් පවත්වාගෙන ගිය ආර්ථික ක්‍රමවේදය ඇනෙන්නත් තිබුණා. එහෙම නොවූ එක ගැන සතුටුයි. ඒත්, ආණ්ඩුවේ කකුලෙන් අදින්නවත්, වට්ටන්නවත් අපි සූදානම් නැහැ. මේ රට හරිම අමාරුවෙන් මෙතැනට ගෙනාවේ. ජනතාව කැපකිරීම්, පරිත්‍යාග බොහොම කළා.

ඉතින්, ටික කලක් හුරු වෙන්න, හුස්ම ගන්න ඉඩ දීලා, නිසි වෙලාව ආවාම ඒ අය බිමින් තැබූ කොඩිය අපි ගන්නවා.

**නුවන් මහේෂ් ජයවික්‍රම**